2

# ණීනැසෘඩි වීෂය

මෙම කරුණු the-catamaran.org ව්‍යාපෘතියේ ® කොටසකි

පත්‍රකලාවේදියාට කෙටි මං : මුද්‍රිත හා අන්තර්ජාල වාර්තාකරණයේ මූලිකාංග

## 2.1 වීෂයඛ් පතෘ්සෘෘ ගණ්තණ් පඛතෂ් ධ?

විෂය, පත්‍රකලාවේදියා කටයුතු කරන ප්‍රජාවට අදාළත්වයක් ඇති විෂයක් විය යුතුය. එය දේශපාලන, ආර්ථික හෝ සාමාජීය සහ සංස්කෘතික අවස්ථාවකට සම්බන්ධ විය හැකිය - මේ සියලුම අංශවලින් ප්‍රජාවේ සියලුම සාමාජිකයින්ට බලපෑමක් ඇත. මෙම බලපෑම ප්‍රාදේශීය මට්ටමේ දී විය හැකිය. නැතහොත් එයින් බලපෑමට ලක් වන්නේ සමස්ත රටම විය හැකිය. පත්‍රකලාවේදියෙක් ඉතා පුළුල් විෂය පරාසයක් තුළ ඇති නව සංවර්ධනයන් කෙරෙහි වැඩි උනන්දුවක් දැක්විය හැකිය. උදාහරණයක් ලෙස, එම පුළුල් විෂය “අධ්‍යාපනය” විය හැකිය. පාසැල් සඳහා වූ අයවැය අඩු කිරීම එම ක්ෂේත්‍රය තුළ ජාතික මට්ටමේ ඇති ආසන්නතම ප්‍රවෘත්තිය විය හැකිය. නැතහොත් ප්‍රාදේශීය මට්ටමේ දී එය නව පාසැලක් විවෘත කිරීම හෝ නව විදුහල්පතිවරයෙක් පත් කිරීම විය හැකිය.
මාධ්‍යයේ එක් එක් ආකාරවලින් ප්‍රවෘත්තිය හා විෂය වෙනස් ආකාරයට ආවරණය කරනු ඇත. උදාහරණයක් ලෙස, විකාශන මාධ්‍යයට පින්තූර අවශ්‍ය වේ; ගුවන්විදුලි මාධ්‍යයට පටිගත කළ සම්මුඛසාකච්ඡා අවශ්‍ය වේ. පුවත්පත් සඳහා නවතම තත්ත්වයන් සම්බන්ධ තොරතුරු අවශ්‍ය විය හැකිය. සෑමවිටම තොරතුරු වහාම පළ නොවන සඟරාවක් සඳහා පත්‍රකලාවේදියා සේවය කරන්නේ නම්, ඔහු හෝ ඇය විසින් නවතම තත්ත්වයන් වෙනස් ආකාරයකට ආවරණය කළ යුතුය.
ප්‍රේක්ෂකයින්/ පාඨකයින්/ ශ්‍රාවකයින් පිළිබඳව සලකා බැලීම ද වැදගත් වේ. මිලියන ගණනක ජනතාව නරඹන සවස ජාතික පුවත් සඳහා සේවය කරන පත්‍රකලාවේදියෙක් ජනතාව දහස් ගණනක් විසින් පමණක් කියවනු ලබන ප්‍රජා පුවත්පතක් සඳහා සේවය කරන පත්‍රකලාවේදියෙක්ට වඩා වෙනස් ආකාරයකින් නවතම තත්ත්වයන් ආවරණය කරනු ඇත.
පත්‍රකලාවේදියෙක් කිසියම් විෂය කාණ්ඩයක් ඇතුලත තමන් ආවරණය කළ යුත්තේ කුමන නවතම තත්ත්වය ද යන්න තෝරා ගැනීමේ දී ඔහු හෝ ඇය සේවය කරන මාධ්‍ය පිළිබඳව සලකා බැලීම වැදගත් වේ.

## 2.2 උෘනසෘණ්‍ය ඛීරීඹධ ත්‍යෘ්ගය ඹෘතෘඛෘන ඛුඹඛ් ධ?

මාතෘකාවක් දේශපාලන, සාමාජීය හෝ සංස්කෘතික ක්ෂේත්‍රවල එදිනෙදා අවස්ථාවන්ට අදාළ විය යුතුය. ආවරණය කළ මාතෘකාව නිවැරදි වේලාවේ දී, නිවැරදි ස්ථානයේ දී මහජනතාවට ළඟා විය යුතුය. බොහෝවිට පත්‍රකලාවේදියා සේවය කරන මාධ්‍යයේ වර්ගය අනුව මාතෘකාව තෝරා ගැනීම තීරණය වේ.

This project is funded by the European Union



## වීඛ්ෂුඦ්ඖ ලැඞීෂ්තුන

1 විෂය පිළිබඳ තොරතුරු අලුත්ම තොරතුරු වන්නේ ද?

2 විෂයට දේශපාලන අදාළත්වයක් තිබෙන්නේ ද?

3 මාතෘකාව ප්‍රේක්ෂකයින්ට/ පාඨකයින්ට/ ශ්‍රාවකයින්ට අදාළ වන්නේ ද? එහි අදාළත්වය ඔවුන්ට පැහැදිලි වී තිබේ ද?

4 මාතෘකාව නිවැරදි මාධ්‍ය මඟින් ආවරණය වී තිබෙන්නේ ද?

5 තොරතුරු නිවැරදි ස්ථානයේ දී නිවැරදි වේලාවේ දී පළ කළ හැකි ද? ප්‍රචාරය කළ හැකි ද?

6 වාර්තාකරණය සමබර ද? වැඩිදුර විකාශන තිබිය හැකි ද?